# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1637/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 29/12/2023<br>පැය 1125 |

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2023.12.28 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 30 | 1080 | යකඩ බැරල් 06 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. තීරුබදු නොගෙවා නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුර.**

2023.12.28 වන දින දහවල් කාලයේ කෑගල්ල පොලිස් වසමේ කෑගල්ල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද නීති විරෝධි දුම්වැටි 182 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කෑගල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ හිඟුල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව දැව කඳන් ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2023.12.29 වන දින අළුයම් කාලයේ පුත්තලම පොලිස් වසමේ මනගුංඩු පාර, ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද

තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව තේක්ක** දැව **කඳන් 20 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වූ පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**